# ආගමන සමයේ දෙවන සතිය
# සෙනසුරාදා

| පළමුවන කියැවීම | උපදේශකයා 48: 1-4, 9-11 |
| --- | --- |

උපදේශකයාගේ පොතෙන් උපුටා ගත් කොටයකි.

*එළියා නැවත පැමිණේ*

එකල්හි එළියා දිවැසිවරයා ගින්නක් මෙන් නැගී ආවේය. ඔහුගේ වචනය ගිනි හුලක් මෙන් ඇවිළුණේය. ඔහු ඔවුන් පිට සාගතයක් පැමිණෙව්වේ ය. තම උද්යෝගයෙන් ඔවුන්ගෙන් විශාල ගණනක් වනසා දැමුවේ ය. සමිඳුන්ගේ වචනයෙන් අහස පියවා දැමුවේ ය. තුන් වරක් අහසේ ගින්න ඇද වැටෙන්නට සැලසුවේ ය. අහෝ එළියා! ඔබ සිදු කළ ප්‍රාතිහාර්යයන් නිසා ඔබ කොපමණ කීර්තිමත් වූයෙහි ද? අභිමානයෙන් ඔබට සමාන වන්නේ කවරෙක් ද? ඔබ ගිනිමය සුළි සුළඟින් හැරගෙන යනු ලැබුවෙහි ය. මතු පැමිණෙන්නට තිබුණු තර්ජනවල දී දේව උදහස කඩා බිඳ ගෙන එන්නට පෙර එය සංසිඳවීමට පියවරුන්ගේ සිත ඔවුන්ගේ දරුවන් දෙසට හැරවීමට ද ජාකොබ්ගේ ගෝත්‍රයන් නැවත පිහිටුවීමට ද ඔබ පත් කරනු ලැබුවෙහි ය. ඔබ දැකීමේ වරය ලබා ගත් අය ද ඔබට ප්‍රේම කරමින් සිට මිය ගිය අය ද භාග්‍යවන්තයෝ ය. මන්ද, අපට ද ජීවිතය හිමි වන හෙයිනි.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 80: 1–2, 14–15, 17–18 |
|---|---|

පිළිතුර: අහෝ දෙවිඳුනි! අප මිදෙන පිණිස ඔබේ සිරි සිත පෙන්නුව මැනව.

ගීය: ජෝශප්ගේ පරපුර බැටළු රැළක් මෙන් ගෙන යන
ඉශ්රායෙල්වරුන්ගේ එඩේරාණෙනි, අපට සවන් දුන මැනව.
කෙරුබ්වරුන් මත අසුන් අරා දර්ශනය වුව මැනව.

අහෝ සව් බලැති දෙවිඳුනි! අප වෙත හැරුණ මැනව.
සග ලොව සිට නෙත් යොමා බලා
සසග මේ මිදි වැල වන අප රැක ගත මැනව.
ඔබේ දකුණතින් රෝපණය කළ දේ බැලුව මැනව.
ඔබට ම සවිමත් කරගත් දේ බැලුව මැනව.

ඔබේ හස්තය ඔබේ දකුණු පස සිටින මිනිසා කෙරෙහි පතිත වේවා!
ඔබේ යහපතට ඔබ ම සවි ශක්තිමත් කළ
ජාතිය කෙරෙහි එය පහළ වේවා!
එවිට අපි කවදාවත් ඔබට පිටුපා නොයන්නෙමු.
අපට ජීවත් වීමට ඉඩ දුන මැනව.
අපි ඔබේ නාමයෙන් අයැද ඔබ පසසන්නෙමු.

## සුපුවත ජය නද

ආලේලූයා! ආලේලූයා!
සම්දුන්ගේ මග පිළියෙළ කරන්න.
එතුමන්ගේ හට ඇද නැති මාවත් සාදන්න.
දෙවියන් වහන්සේ කෙරෙන් වන විමුක්ති මාර්ගය
සියලු සතුන් දකිනු ඇත්තේ ය.
ආලේලූයා!

| සුවිශේෂය | මතෙව් 17: 10–12 |
|---|---|

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*එලියා පැමිණි නමුත් ඔව්හු එතුමන් හැඳින නොගත්හ.*

ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෝ කතා කොට, “එසේ නම්, එලියා පළමුවෙන් එන්න යුතු ය යි විනයධරයන් කියන්නේ මන් දැ” යි උන් වහන්සේගෙන් ඇසූහ. උන් වහන්සේ උත්තර දෙමින්, “එලියා එන බව ඒකාන්තය. ඔහු අවුත් සියල්ල යළි පිහිටුවන්නේ ය. එහෙත්, ඔබට කියමි, එලියා දැනට ම පැමිණි සිටියි.

ඔව්හු ඔහු නොහැඳින, තමන් රිසි දෙය ඔහුට කළහ. එලෙස ම ඔවුන් මනුෂ්‍ය පුත්‍රයාණන් ට ද පීඩා කරනු ඇතැ” යි ඔවුන්ට වදාළ සේක. උන් වහන්සේ මෙය කීමේ ස්නාවක ජුවාම් ගැන බව ශ්‍රාවකයෝ තේරුම් ගත්හ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*